සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்

**Sabaragamuwa Provincial Department of Education**

| | |
|---|---|
| තෙවන වාර පරීක්ෂණය 2017 | 11 ශ්‍රේණිය |
| மூன்றாம் தவணைப் பரீட்சை 2017 | தரம் 11 |
| **Third Team Test 2017** | **Grade 11** |

බුද්ධ ධර්මය I

**Buddhist I**

පැය එකයි

**One hours**

නම/විභාග අංකය : ..................................................................

- **නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.**

1. දේව ආරාධනාව ලැබූ බෝසතුන් මව්කුස පිළිසිඳ ගැනීමට පංච මහා විලෝකනය මගින් පූර්ව අධ්‍යයනයක් කරනු ලැබූයේය. එයින් කෙනෙකුගේ ජීවිතයට ගතහැකි ආදර්ශය නම්,
   1. කිසිවෙකුට අවනත නොවිය යුතුය යන්නයි
   2. අන් අයගේ උදව් උපකාර ලබාගත යුතු බවයි.
   3. සිතා විමසා බලා කටයුතු කළ යුතුය යන්නයි
   4. තමාගේ අවශ්‍යතාව අනුව කටයුතු කළයුතුය යන්නයි

2. කුමාර ආවදියේදී සර්වමිත්‍ර ගුරුතුමාගෙන් රජ කුමාරයකුට අවශ්‍ය ශිල්ප උගත්තේය තාපස අවදියේ අෂ්ඨ සමාපත්තිලාභී ගුරුවරයා වූයේ,
   1. භග්ගව තවුසානෝය
   2. උද්ධකරාම පුත්ත තාපසයානෝය
   3. අසිත තාපසයානෝය
   4. ආලාර කාලාම තවුසානෝය

3. සංඝරත්නය විසින් බොහෝ ශාසනික සමාජ සේවාවන් රැසක් ඉටු කරයි. සංඝරත්නයේ ගුණ අතරට අයත් නොවන්නේ,
   1. ආහුනෙය්‍යය
   2. පාහුනෙය්‍යය
   3. දක්ඛිනෙය්‍යය
   4. ඒහිපස්සික

4. නිදිබර බව, උදාසීනකම, ඉගෙනුමට බාධාවකි එය පංචනීවරණ අතර,
   1. ථීනමිද්ධයකි
   2. විචිකිච්ඡාවයි
   3. කාමච්ඡන්දයයි
   4. ව්‍යාපාදයයි

5. සංසාරගත දුකින් මිදී නිවන් දැකීමට උපකාරි වන භාවනාව නම්,
   1. සමථ භාවනාවයි
   2. විදර්ශනා භාවනාවයි
   3. බුද්ධානුස්සති භාවනාවයි
   4. ආනාපානාසති භාවනාවයි

6. සත්වයා වනාහි ස්කන්ධ ධාතු එකතුවකි එම ස්කන්ධ වලට අයත් නොවන්නේ,

1. රූප 2. වේදනා 3. සංඛාර 4. කාමච්ඡන්ද

7. "මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස මිස කිසි කලෙකත් රජසැප පිණිස නොවන්නේය. එමම ප්‍රකාශය කළ රජතුමා,

1. වළගම්බා රජතුමා 2. පළමුවන විජබා රජතුමා

3. පණ්ඩුකාභය රජතුමා 4. දුටුගැමුණු රජතුමා

8. වැලිවිට අසරණ සරණ සංඝරාජ හිමියන් විසින් රචිත ග්‍රන්ථයකි

1. සතර බණවර සන්නය 2. ථූපවංශය

3. ජාතකට්ඨ කථාව 4. ලෝවැඩ සඟරාව

9. ශීලයෙහි පදනම ලජ්ජාව හා භය වේ ගිහියා විසින් අනුගමනය කළයුතු නිත්‍ය ශීලය නම්,

1. සාමණේර සිල් 2. අට සිල්

3. පන්සිල් 4. දස සිල්

10. සිල් රැකීමෙන් ලැබෙන ආනිසංස පහකි එයට අයත් නොවන්නේ,

1. කීර්තිය පැතිරීම 2. සිහි මුලා නොවී කළුරිය කිරීම

3. මරණින් මතු සුගතියෙහි උපත ලැබීම 4. මරණින් මතු දුගතිගාමී වීම

11. සිඟාලෝවාද සූත්‍රයෙහි සඳහන් පරිදි භෝග විනාශ මුඛ ගණන,

1. 8 කි 2. 6 කි 3. 4 කි 4. 10 කි

12. දුශ්ශීලව නොසන්සුන් සිත් ඇතිව අවුරුදු සීයක් ජීවත්වනවාට වඩා සිල්වත්ව සන්සුන් සිත් ඇතිව එක දවසක් ජීවත්වීම ශ්‍රේෂ්ඨය යන අදහස කියවෙන ධම්මපද ගාථාව වන්නේ,

1. යෝචේ වස්ස සතං ජීවේ යන ගාථාවය 2. අචරිත්වා බ්‍රහ්ම චරියං යන ගාථාවය

3. උට්ඨාන වතෝ සතිමතො යන ගාථාවය 4. සුකරානි අසාධුනි යන ගාථාවය

13. ව්‍යග්ගපජ්ජ සූත්‍රයෙහි සඳහන් මොලාව දියුණුවට අදාල සතර සම්පදාවනට අයත් වන්නේ,

1. දැහැමිව ධනය ඉපදීම 2. දන්දීම

3. කල්‍යාණමිත්තතා 4. පාපයෙහි නොඇලීම

14. කේසපුත්ත ග්‍රාමවාසී කාලාමයනට දේශනා කළ සූත්‍රය නම්,

1. කාලාම සූත්‍රය 2. ව්‍යග්ගපජ්ජ සූත්‍රය

3. මංගල සූත්‍රය 4. සිඟාලෝවාද සූත්‍රය

15. දානය, ප්‍රිය වචනය, අර්ථචර්යාව හා සමානාත්මතාව යනු
    1. සතර සංග්‍රහ වස්තූන්ය    2. සතර බඹ විහරණ
    3. සතර සම්පදා    4. සතර බණවර

16. චුල්ලකම්ම විභංග සුත්‍රයට අනුව පුද්ගල විෂමතා 14 ක් දේශනා කර ඇත. මෙම සුත්‍රය දේශනා කරන ලද්දේ,
    1. දීඝජානු කෝලිය සිටු පුත්‍රයාටය    2. සුභ තරුණයාටය
    3. සිඟාලක තරුණයාටය    4. මට්ටකුණ්ඩලී තරුණයයා

17. "සංඛාර නිරෝධෝ විඤ්ඤාණ නිරෝධා" මෙහි සංඛාරා යනු,
    1. නාම - රූප වේ    2. සළායතන වේ
    3. තණ්හාව වේ    4. කුසලා කුසල කර්මවේ

18. ලාභ, අලාභ අයස යසස නින්දා ප්‍රසංසා සැප දුක හා අටලෝ දහමින් කම්පා නොවීම
    1. අරහං බුදු ගුණයයි    2. තාදී ගුණයයි
    3. අසරණ සරණ ගුණයයි    4. පුරිසධම්ම සාරථී ගුණයයි

19. පරිසරය විනාශ කිරීමට කරන මිනිස් ක්‍රියාකාරකම් අතර ඉතාමත් අහිතකර ක්‍රියාවකි,
    1. ගහකොළ වැනසීමය    2. ජලයට අපද්‍රව්‍ය දැමීමය
    3. මැසි මදුරුවන් බෝවන ස්ථාන ගැන නොතැකීමයි    4. මල් පලතුරු නොවැවීම

20. ආහාරයේ පමණ දැක අනුභව කිරීම "ආහාරේ මත්තඤ්ඤුතාව" පිළිබඳව ඉගැන්වෙන සුත්‍රය නම්,
    1. පත්තකම්ම සුත්‍රය    2. පරාභව සුත්‍රය
    3. භද්දාලී සුත්‍රය    4. මංගල සුත්‍රය

21. නව රට බුදු සසුන පිහිටුවීම සඳහා ධර්ම දූත කණ්ඩායම් යැවුයේ ................................ ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙසටයි.
    1. පළමුවන ධර්ම සංගායනාව    2. දෙවන ධර්ම සංගායනාව
    3. තුන්වැනි ධර්ම සංගායනාව    4. හතරවැනි ධර්ම සංගායනාව

22. පුස්ථාරූඪ සංඝීතිය නම්,
    1. පළමුවන ධර්ම සංගායනාව    2. දෙවන ධර්ම සංගායනාව
    3. තුන්වැනි ධර්ම සංගායනාව    4. හතරවැනි ධර්ම සංගායනාව

23. ත්‍රිවිධ චෛත්‍යය වන්දනා කළයුතු අනුපිළිවෙල නම්,
    1. ශාරීරික උද්දේශික පාරිභෝගික වශයෙනි    2. ශාරීරික පාරිභෝගික උද්දේශික වශයෙනි
    3. පාරිභෝගික ශාරීරික උද්දේශික වශයෙනි    4. උද්දේශික පාරිභෝගික ශාරීරික වශයෙනි

24. අනුරාධපුර මහමෙව්නාවෙහි නිර්මිත සුප්‍රසිද්ධ සමාධි ප්‍රතිමාවේ නිර්මාණය කර ඇති මුද්‍රාව නම්,

1. භූමි ස්පර්ශ මුද්‍රාවය
2. විතර්ක මුද්‍රාවය
3. ධ්‍යාන මුද්‍රාවය
4. ධර්මචක්‍ර මුද්‍රාවය

25. සැළලිහිණි සනුදේශය පරෙවි සන්දේශය කාව්‍ය ශේඛරය පඤ්චිකාප්‍රදීපය හා බුද්ධිප්පසාදිනිය යන ග්‍රන්ථ රචනා කළ ස්වාමීන් වහන්සේ නම්,

1. වැත්තෑවේ හිමියන්ය
2. තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්ය
3. ධර්මසේන හිමියන්ය
4. බුද්ධ පුත්‍ර හිමියන්ය

26. උත්සාහයෙන් දැතේ වීර්යයෙන් දහඩිය වගුරුවමින් ධාර්මිකව උපයා සපයාගත් ධනයක් තමාට ඇතැයි සතුටුවීම,

1. අත්ථි සුඛ
2. භෝග සුඛ
3. අන්ත සුඛ
4. අනවජ්ජ සුඛ

27. තණ්හාවෙන් මානයෙන් හා මිත්‍යා දෘෂ්ටියෙන් තොරව කරුණාව හා උපාය කෞශල්‍යයෙන් යුතුව පුරණ ගුණ ධර්ම සමූහය,

1. දස පුණ්‍ය ක්‍රියා නම් වේ
2. දස කුසල් නම් වේ
3. දස පාරමිතා නම් වේ
4. මේ සියල්ලම වේ

28. විදර්ශනා භාවනාවට අයත් භාවනාවකි,

1. බුද්ධානුස්සතිය
2. දේවතානුස්සති
3. මරණානුස්සති
4. චිත්තානුපස්සනා

29. වැරදි කරන්නන් අතර නිවැරදිව පිරිසිදු ජීවිතයක් සඳහා හුරුවීම,

1. නිවැරදි ජීවිතයකි
2. ත්‍රිශික්ෂාවයි
3. දැහැමි දිවිපෙවෙතය
4. පද්මාකාර ජීවිතය

30. මෙත්තා කරුණා මුදිතා උපේක්ඛා යනු,

1. සිව්ඹඹ විහරණයි
2. චතුරාර්ය සත්‍යයි
3. සිව් පසයයි
4. සිව් සඟරාවකය

31. සිත කය වචනය යනු,

1. ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා
2. ත්‍රිවිධ දාන
3. ත්‍රිවිද්‍යා
4. ත්‍රිවිධ දොරටු වේ

32. දුක්ඛ දුක්කතා විපරිණාම දුක්ඛතා හා සංඛාර දුක්ඛතා ලක්ෂණ මුල් කරගත් සත්‍යය,

1. දුක්ඛ සත්‍යය
2. දුක්ඛ සමුදය සත්‍යය
3. දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය
4. දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා සත්‍යය

33. සැමියා බිරිඳට ඉටුකළ යුතුකම් පහකි. එම යුතුකම් අතරට අයත් නොවන්නේ,

1. ගරු කිරීම
2. අවමන් නොකිරීම
3. උපයන ලද ධනය ආරක්‍ෂා කිරීම
4. ඇඳුම් පැළඳුම් සපයාදීම

34. මංගල ධර්ම දේශනාව සඳහා බුදුරජාණන් වහන්සේ වැඩම කළේ,

1. වේළුවනාරාමයට
2. ඉසිපතනාරාමයට
3. ජේතවනාරාමයට
4. පූර්වාරාමයට

35. බුදුරජාණන් වහන්සේගේ අසරණ සරණ ගුණයට උදාහරණයකි,

1. අලව්යකුට පිහිටවීම
2. අංගුලිමාලට පිහිටවීම
3. සුනීතට පිහිටවීම
4. පූතිගතතිස්ස තෙරුන්ට පිහිටවීම

36. උදය බමුණාගේ ආරාධනයෙන් බුදුන් වහ්නසේ ඇතුළු ශ්‍රාවක පිරිස දොළොස්වන වස්කාලය ගතකළේ,

1. සැවැත්නුවරය
2. වේරංජා නුවරය
3. බරණැස් නුවරය
4. කිඹුල්වත් නුවරය

37. සමාජ සාපරාධී ක්‍රියාවනට හේතුව අසීමිත ආශාවන්ගෙන් යුක්ක වීමයි. එයින් මිදීම පිළිබඳව ඉගැන්වෙන පාරමිතාව වන්නේ,

1. නෙක්ඛම්ම පාරමිතාවයි
2. දාන පාරමිතාවයි
3. ශීල පාරමිතාවයි
4. වීර්‍ය පාරමිතාවයි

38. උඩඟු නොව මහණ" යන ආදර්ශ පාඨය කුටියට ඇතුළු වන දොරටුවෙහි ප්‍රදර්ශනය කළ නාහිමි,

1. වල්පොළ රාහුල හිමි
2. වැතත්වේ හිමි
3. අසරණ සරණ සංඝරාජ හිමි
4. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි

39. දුටුගැමුණු රජ විසින් මිරිස් ව්‍යාංජනයක් සංඝයාට පූජා නොකර අනුභව කළ වරදට තමන්ම දඬුවම් පමුනුවා තනවන ලද චෛත්‍යය,

1. සෝමාවතියයි
2. මිරිසවැටියයි
3. රුවන්මැලි මහා සෑයයි
4. අභයගිරි දාගැබයි

40. දැනට ඉතිරිව ඇති ඓතිහාසික බෝධිඝරය පිහිටා ඇත්තේ,

1. අනුරාධපුරයේය
2. මහනුවරය
3. නිල්ලක්ගමය
4. කැළණියේය

**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்**

**Sabaragamuwa Provincial Department of Education**

| | |
|---|---|
| **තෙවන වාර පරීක්ෂණය 2017** | **11 ශ්‍රේණිය** |
| **மூன்றாம் தவணைப் பரீட்சை 2017** | **தரம் 11** |
| **Third Team Test 2017** | **Grade 11** |

| | | |
|---|---|---|
| **බුද්ධ ධර්මය** | **II** | **පැය දෙකයි** |
| **Buddhist** | **II** | **Two hours** |

- **පළමු ප්‍රශ්නය ඇතුළු තවත් ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**
- **කෙටි පිළිතුරු සපයන්න. එක් පිළිතුරකට ලකුණු 2 බැගිනි**

(01). i. බෝසතාණන් වහන්සේ දුටු සතර පෙර නිමිති මොනවාද? (ලකුණු 02)

ii. ශ්‍රද්ධාවේ ප්‍රභේද දෙක ලියන්න. (ලකුණු 02)

iii. දස පාරමිතාවන්ගෙන් දෙකක් ලියා එම පාරමිතාවලට උදාහරණ ජාතක කතා දෙකක් නම් කරන්න. (ලකුණු 02)

iv. "විශේෂේණ පස්සතිති විපස්සනා" මෙම පාඨයෙහි අදහස ලියන්න. (ලකුණු 02)

v. නියාම ධර්ම 3 කි ඉන් දෙකක් ලියන්න. (ලකුණු 02)

vi. පුරිසධම්ම සාරථී ගුණයට උදාහරණ දෙකක් දෙන්න. (ලකුණු 02)

vii. කර්මය හඳුන්වන නිබ්බේධික සූත්‍රයේ සඳහන් පාලි පාඨය ලියන්න. (ලකුණු 02)

viii. "යේධම්මා හේතු පහවා - තේසංහේතු තතගාතෝ ආහ" මෙම පාඨයෙන් හඳුන්වන ඉගැන්වීම කුමක්ද? (ලකුණු 02)

ix. අවුකන බුද්ධ ප්‍රතිමාවේ සහ සමාධි ප්‍රතිමා වෙත දක්නට ලැබෙන මුද්‍රා මොනවදා? (ලකුණු 02)

x. "සමනාමයං මහාරාජ" මෙම ගාථාව සම්පූර්ණ කර ලියන්න. (ලකුණු 02)

(02). i. වචී කර්මයට අයත් අකුසල කර්ම මොනවාද? (ලකුණු 02)

ii. අකුසල මූල නම් කරන්න ඉන් එකක් හඳුන්වන්න. (ලකුණු 03)

iii. පන්සිල් ආරක්ෂා කිරීම පුද්ගල සංවර්ධනයට හා සමාජ සංවර්ධනයට බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(03). i. උත්සහයෙන් නිවැරදි සිහියෙන් කටයුතු කරන අයගේ යසස වැඩේ යන දහස ඇතුළත් ධම්ම පද ගාථාව ලියන්න. (ලකුණු 02)

ii. එම ගාථාවෙහි සඳහන් දියුණුවන්නකු තුළ තිබිය යුතු ලක්ෂණ 7 කි ඒවා මොනවාද? (ලකුණු 03)

iii. ධම්මපදය ඇසුරෙන් උදාහරණ දක්වමින් සමාජ ජීවිතය යහපත් මාර්ගයට ගතහැකි ආකාකරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(04). i. සිගාලෝවාද සූත්‍රයේ සඳහන් ආකාරය සැමියාගෙන් බිරිඳට ඉටුවිය යුතුකම් වලින් දෙක් ලියන්න. (ලකුණු 02)

ii. සැමියා හා බිරිඳ යුතුකම් ඉටු නොවීම නිසා ඇතිවියහැකි අවිටු විපාක හතරක් ලියන්න. (ලකුණු 03)

iii. "සමාජය දැලක් වැනිය" ඉන් මිදිය නොහැකිය මේ පිළිබඳව ඔබේ අදහස් මොනවාද? (ලකුණු 05)

(05). i. අවිධිමත්ම මෙන්ම ගිජු ලෙස ආහාර අනුභව කරන්නන් පස් දෙනෙකු ගැන බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ ඉන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

ii. ආහාර අනුභවයේදී නොකළ යුතු දේ සේඛියා ලෙස හැඳින්වේ. ඉන් හයක් ලියන්න. (ලකුණු 03)

iii. නිවැරදි ආහාර අනුභවය නිසා නිරෝගීකම රැකේ සේඛියා ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(06). i. පළමුවන ධර්ම සංගායනාවට ආසන්නම හේතුව වන සුභද්‍රගේ අභද්‍ර වචනය කුමක්ද? (ලකුණු 02)

ii. පළමු දෙවන හා තෙවන ධර්ම සංගායනා පැවැත් වූ ස්ථාන මොනවාද? (ලකුණු 03)

iii. මහින්දාගමනයෙන් පසු ශ්‍රී ලංකාව තුළ ඇතිවන බෞද්ධ ප්‍රබෝධය විස්තර කරන්න. (ලකුණු 05)

(07). පහත සඳහන් මාතෘකා වලින් දෙකක් ගැන කෙටි සටහන් ලියන්න.

i. ප්‍රස්ථාරූඪ සංගීතිය (ලකුණු 02)

ii. ධම්ම පදය (ලකුණු 03)

iii. ලංකාවේ බුදු පිළිම (ලකුණු 05)

iv. සීලය (ලකුණු 05)